| 42 | FO | IM | 04 |
|---|---|---|---|

# ආනයන කටයුතු සම්බන්ධයෙන් වූ හානිපූරණ ලිපිය.

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී,**
(සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය: PQ 27)
අංක. 40, නවම් මාවත,
කොළඹ 02.

හිතවත් මහත්මයාණනි,

**(1) නාවික ඇපකර ලේඛන අත්සන් කිරීම සම්බන්ධයෙන් වූ හානිපූරණය**

නෞභාරපත්‍ර අපේක්ෂාවෙන් යුතුව කලින්කල නැව් භාණ්ඩ තොගය නිදහස්කරන ලෙස අප විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීම ප්‍රකාරව යම් නැව් නියෝජිත ආයතනයක්/ සංවිධානයක් අමතන ලද හානිපූරණ/ ඇපකර ලිපි ඔබ විසින් අනුඅත්සන් කිරීම පිළිබඳ සැලකිල්ලට ගෙන, ............................................................ යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තා වූ ද ශ්‍රී ලංකාවේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන (සමාගම් ලියාපදිංචි කිරීමේ අංක. ................. දරන) ........................................... වන අප විසින් එකී හානිපූරණ/ ඇපකර ලිපි ලියා අත්සන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පැනනැගිය හැකි සියලු පාඩු සහ ප්‍රතිවිපාකවලින් ඔබව මෙයින් නිදහස්කර හානිපූරණයකර තබනු ලැබේ.

(i) ශ්‍රී ලංකාවේ අදාල නීතිය ප්‍රකාරව නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුලත පිටපත් කරන ලද ලේඛනවලට අනුරූප මුල් ලේඛන සපයන බවට අප විසින් මෙයින් වෙනස්කල නොහැකි ලෙස එකඟව වගකීම් භාරගෙන සිටිනු ලැබේ.

(ii) අපගේ ඉල්ලීම පරිදි නිකුත්කරන ලද පිළිවෙලින් වූ නාවික ඇපකරය හේතුවෙන් සිදුවිය හැකි සියලු ප්‍රතිවිපාකවලට එරෙහිව මෙන්ම ඉහතකී පරිදි එම ඇපකර ලිපි/ හානිපූරණ ලිපි ඔබ විසින් අත්සන් කිරීම හේතුවෙන් මෙන්ම එම භාණ්ඩ අපවෙත භාරදීම හෝ ඒ හා සම්බන්ධ අන්‍යාකාර හේතුවක් නිසා ඔබ විසින් විඳිනු ලැබිය හැකි හෝ දරනු ලැබිය හැකි විනිමය අනුපාතිකවල උච්චාවචනයවීම් හේතුවෙන් සිදුවිය හැකි පාඩු ඇතුලු සියලු ඉල්ලීම්, නඩු, නඩුකටයුතු, වගකීම්, හිමිකම්පෑම්, අලාභ, පාඩු, පිරිවැය සහ වියදම්වලට එරෙහිව අපගේ ඉල්ලීම පරිදි නිකුත්කල පිළිවෙලින් වූ නාවික ඇපකරයේ

සඳහන් සම්පූර්ණ වටිනාකමට ඔබව හානිපූරණය කර නිදහස්ව තබන බවටත්, එමගින් හෝ ඒ තුලින් උපචිතවන ප්‍රතිවිපාක හේතුවෙන් ඔබ විසින් දරන හෝ විඳින ලද සියලු ගෙවීම්, පාඩු, පිරිවැය සහ වියදම් ඉල්ලා සිටීමේ දී ඔබ වෙත වහාම ගෙවන බවටත් නෞභාරපත්‍රය හෝ වෙනත් හිමිකම් ලේඛන අප වෙත ලැබීමේ දී යථාපරිදි පිටසන්කර ඔබවෙත භාර දෙන බවට හෝ එම ඇපකරය (ඇපකර)/ හානිපූරණය (හානිපූරණ) ආපසු භාරදීම හෝ මුදාහැරීම සිදු කරන බවටත් අප විසින් මෙයින් වෙනස්කල නොහැකි ලෙස සහ කොන්දේසි විරහිත ලෙස එකඟව සිටිනු ලැබේ.

(iii) ප්‍රතිග්‍රහන නියමයන්ට එරෙහිවූ ලේඛන යටතේ වන බිල්පත් සම්බන්ධයෙන් අප වෙනුවෙන් ලියනුලබන හුවමාරු බිල්පත් පිළිගන්නා බවට අප විසින් වෙනස්කල නොහැකි ලෙස එකඟව වගකීම් භාරගෙන සිටිනු ලැබේ.

(iv) යාත්‍රා අයිතිකරුවන්/ නියෝජිතයන් හෝ අදාල නෞභාර පත්‍ර දරන්නන් විසින් ඔබගෙන් හෝ යාත්‍රා නියෝජිතයන් හරහා ගෙවීම් කරන ලෙස ඉල්ලා සිටින අවස්ථාවක දී, ඔබ විසින් අපගේ ඇපකරය/ හානිපූරණය අනුඅත්සන් කර ඇත්තේ යම් උපරිම මුදලක් දක්වා ද එම මුදල දක්වා එම ගෙවීම් සපුරාලන ලෙස සහ සලකන ලෙස මෙයින් ඔබවෙත බලය පවරා සිටිනු ලැබේ. එම ගෙවීම් ඉල්ලා සිටීමේ දී ගෙවිය යුතු වන අප වෙත ප්‍රදානයකර ඇති ණය මුදලක් වශයෙන් ඒ මතවූ පොළිය ද සමග ඉල්ලාසිටීමේ දී එම ණයමුදල ගෙවා නිමකිරීමට අප විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ.

(v) ඕනෑම ආකාරයක වෙනස්කම් එම බිල්පත්වල පැවතිය ද ඒ පිළිබඳව නොසලකා හරිමින් තවදුරටත් අපගෙන් විමසීමකින් තොරව ඔබගේ අනුරූප ආයතනයෙන් අදාල මුල් ලේඛන ලැබීමේ දී බිල්පත් අවසන්කිරීම සඳහා අප විසින් මෙයින් ඔබ වෙත බලය පවරා සිටිනු ලැබේ. එවැනි සියලු වෙනස්කම් මෙයින් අත්හැර දමනු ලැබේ. ඔබ විසින් නෞභාරපත්‍රය පිළිවෙලින් වූ යාත්‍රා නියෝජිත වෙත ඉදිරිපත්කර ඇපකරය/ හානිපූරණය අවලංගු කිරීමේ අදාල ලිපිය ලබාගත යුතුවේ.

(vi) මුල් ඉන්වොයිස්පත්‍රයේ සඳහන් භාණ්ඩවල වටිනාකම අදාල ඇපකර/ හානිපූරණ ලිපියේ සඳහන් භාණ්ඩ වටිනාකම නොඉක්මවිය යුතු බවට අප විසින් තවදුරටත් තහවුරුකර සිටිනු ලැබේ.

(vii) හඳුනාගත් භාණ්ඩ ආනයනය කිරීම සම්බන්ධයෙන් සහ අප විසින් ඒ සම්බන්ධයෙන් කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් ඔබ විසින් නියම කරනු ලැබිය හැකි සියලු විනිමය පාලන සහ ආනයන පාලන ලේඛන ඔබ විසින් ඉල්ලා සිටීමේ දී ඔබ වෙත සපයන බවට අප විසින් වගකීම් භාරගෙන සිටිනු ලැබේ.

(viii) භාණ්ඩවල අන්තර්ගතයන්, තත්ත්වයන්, ප්‍රමිතිය, ප්‍රමාණය හෝ නිශ්චිත කරුණ සම්බන්ධයෙන් එනම් උදාහරණ වශයෙන් සියලු ආකාරයෙන්ම අපගේ අවදානම් දැරීම සහ වගකීම් යටතේ අප විසින් සම්පූර්ණයෙන්ම නිශ්කාශනය කරගනු ලබන ඇසුරුම්වල බර සහ/හෝ වටිනාකම සහ/හෝ ඇතුලත්කර ඇති මිලගණන් සම්බන්ධයෙන් වූ කිසිදු සාවද්‍ය පැහැදිලිකිරීම් හෝ වැරදි සහගත තත්ත්වයන් (වංචා සහගත තත්ත්වයන් වුව ද) සම්බන්ධයෙන් ඔබ කිසිදු ආකාරයකින් වගකීමට බැඳී නොසිටින බවට අප විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ.

(xi) මේ යටතේ වූ අපගේ වගකීම් සපුරාලනු ලබන තෙක් ඉහතකී ආකාරයට අප විසින් නිශ්කාශනය කරගනු ලබන භාණ්ඩ හෝ ඒවායේ විකුණුම් ප්‍රතිශ්ඨා මුදල් බැංකුව වෙනුවෙන් අප විසින් භාරයක් වශයෙන් දරනු ලබන බවත් එම විකුණුම් ප්‍රතිශ්ඨා මුදල් ඔබ විසින් ලබාගත හැකි පරිදි දරනු ලබන බවටත් අප විසින් මෙයින් තවදුරටත් එකඟව සිටිනු ලැබේ.

(x) ඉහත කී ආකාරයට අප විසින් නිශ්කාශනය කරනු ලබන එක් එක් නැව් භාණ්ඩ තොග අලෙවි කරනු ලබන තෙක් එම භාණ්ඩ ඔබ විසින් නියම කරනු ලබන ආකාරයට ගින්න, සොරකම සහ වෙනත්යම් සාමාන්‍ය අවදානම් හෝ වෙනත් හේතු සහ අවිනිශ්චිත තත්ත්වයන්ට එරෙහිව යථාපරිදි රක්ෂණයකර තබනු ලබන බවට අප විසින් මෙයින් සහතිකකර සිටින අතර ඔබ විසින් ඉල්ලා සිටියහොත් හෝ ඉල්ලා සිටීමේ දී ඔබ වෙත රක්ෂණ ඔප්පුව පවරා දෙනු ලබන බවටත් මේ යටතේ වූ අපගේ වගකීම් ඉටුකරනු ලබන තෙක් එම රක්ෂණ ඔප්පුව යටතේ ගෙවනු ලබන රක්ෂණ මුදල් ඔබ විසින් ලබාගත හැකි වන පරිදි දරනු ලැබිය යුතු බවටත් අප වෙත එම මුදල් ලැබුණහොත් එම මුදල් ඔබ වෙත ගෙවනු ලබන තෙක් ඔබ වෙනුවෙන් භාරගත් ලෙස අප විසින් දරනු ලබන බවටත් අප විසින් එකඟව සිටිනු ලැබේ.

(xi) එම අවස්ථාවේ දී ඔබ විසින් අපවෙත ලබාදෙන මුදල්වලට එරෙහිව ඔබ විසින් ගෙවනු ලබන මුදල් පිළිබඳව අපගෙන් කලින් විමසීමකින් තොරව සියලු ගෙවීම්,

පාඩු, පිරිවැය, පොළිය සහ වියදම් හෝ හිලව්කිරීම් සඳහා ඉහතකී ගිණුමෙන් සීමා ඉක්මවා මුදල් ආපසු ලබා ගැනීමේ ප්‍රමාණය දක්වා පවා අපගේ ගිණුමෙන් මුදල් හරකර ගැනීම සඳහා අප විසින් ඔබ වෙත මෙයින් බලය පවරා සිටිනු ලැබේ.

(xii) ඔබගේ ඇපකර කොමිස් මුදල්, තැපැල්ගාස්තු සහ මුද්දර ගාස්තු සහ වෙනත් ගාස්තු ඇත්නම් එම ගාස්තු අපගේ ගිණුමෙන් අයකර ගැනීම සඳහා අප විසින් තවදුරටත් ඔබට බලය පවරා සිටිනු ලැබේ.

(xiii) අප විසින් කලින් කල ඉල්ලා සිටිනු ලබන ඉහත සඳහන් ගනුදෙනු කටයුතුවල වෙනත් කිසිදු බැංකුවක් විසින් යෙදී නොසිටින බවට අප විසින් සහතික කර සිටිනු ලැබේ.

**2. ඉන්වොයිස්පත්‍රවල පූර්ව පිටපත් මුද්‍රාතබා සහතික කිරීම සම්බන්ධයෙන් වූ හානිපූරණය.**

නැව් භාණ්ඩ ලේඛන පැමිණීමට පෙරාතුව මා/ අප විසින් නැව් භාණ්ඩ තොගය කඩිනමින් නිශ්කාශනය කිරීම පිණිස නැව් භාණ්ඩ ලේඛනවල පූර්ව පිටපත්මත පිටසන් යොදන ලෙස අප විසින් කරන ලද ලිඛිත ඉල්ලීමට අනුකූලව ඔබ විසින් ක්‍රියා කිරීම පිළිබඳ සැලකිල්ලට ගෙන, අප විසින් පහත පරිදි මෙයින් වෙනස්කල නොහැකි ලෙස එකඟව වගකීම් භාරගෙන සිටිනු ලැබේ; එනම්-

(i) ශ්‍රී ලංකාවේ අදාල නීති ප්‍රකාරව නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුලත පිටපත් ලේඛනවලට අනුරූප මුල් ලේඛන සපයන බවට අප විසින් මෙයින් වෙනස්කල නොහැකි ලෙස එකඟව වගකීම් භාරගෙන සිටිනු ලැබේ.

(ii) ඉහත කී ආකාරයට නැව් භාණ්ඩ ලේඛනවල පූර්ව පිටපත් ඔබ විසින් පිටසන් කිරීම හේතුවෙන් හෝ එකී භාණ්ඩ මා වෙත/ අප වෙත භාරදීම හේතුවෙන් හෝ ඒ හා සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් ඔබ විසින් විඳිනු ලැබිය හැකි හෝ දරනු ලැබිය හැකි විනිමය අනුපාතික උච්චාවචනය වීම හේතුවෙන් සිදුවන පාඩු ඇතුලු ඒ හා සම්බන්ධ සියලු ප්‍රතිවිපාකවලට එරෙහිව සහ සියලු ඉල්ලීම්, නඩු, නඩුකටයුතු, වගකීම්, හිමිකම්පෑම්, අලාභ, පාඩු, පිරිවැය සහ වියදම්වලට එරෙහිව කොන්දේසි විරහිතව ඔබව හානිපූරණයකර නිදහස්ව තබන බවටත් එහි ප්‍රතිඵලයක් ලෙස හෝ ඒ සම්බන්ධයෙන් උපචිත වන ඔබ විසින් දරන ලද හෝ විඳින ලද සියලු ගෙවීම්, පාඩු, පිරිවැය සහ වියදම් ඉල්ලා සිටීමේ දී වහාම

ඔබ වෙත ගෙවන බවටත් මා/ අප විසින් මෙයින් කොන්දේසි විරහිතව එකඟව සිටිනු ලැබේ.

(iii) ඉහත කී ආකාරයට ඕනෑම හේතුවක් නිසා මාගේ/ අපගේ වගකීම් සපුරාලීමට මා/ අප අපොහොසත්වන අවස්ථාවක දී, එවිට ඔබගේ බැංකුව සතුවන වෙනත් සියලු අයිතිවාසිකම්වලට අගතිවිරහිතව ඔබ විසින් එසේ ඉල්ලාසිටින මුදල ණය ගිණුමෙන් හරකිරීම සඳහා හෝ මා/ අප විසින් ඔබගේ බැංකුව සමග පවත්වන වෙනත් යම් ගිණුමකින් එම මුදල් හරකර ගැනීම සඳහා ඔබ වෙත මෙයින් බලය පවරා සිටින අතර ඇපකරයේ සීමාව සහ ඇපකරය බලාත්මක කිරීම, පොළිය ආදිය ගෙවීම සහ මා වෙත/ අප වෙත දැනුම්දීමට යටත්ව මේ ගනුදෙනුව සම්බන්ධයෙන් දරන ලද යම් ගාස්තු ඇතුලුව එසේ හරකරගන්නා ලද මුදල එම ණය ගිණුම හෝ වෙනත් යම් ගිණුම පවත්වාගෙන යනු ලබනුයේ යම් නියම හා කොන්දේසිවලට යටත්ව ද එම සියලු නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(iv) මේ යටතේ වූ අපගේ වගකීම් අප විසින් සපුරාලනු ලබන තෙක් ඉහත කී ආකාරයට මා/ අප විසින් හිමිකම්පානු ලබන භාණ්ඩ හෝ ඒවායේ විකුණුම් ප්‍රතිශ්‍යා මුදල් ඔබගේ බැංකුව වෙනුවෙන් භාරයක් වශයෙන් අප විසින් දරන බවටත් එම විකුණුම් ප්‍රතිශ්‍යා මුදල් ඔබ විසින් ලබාගත හැකි පරිදි දරනු ලබන බවටත් මා/අප විසින් මෙයින් තවදුරටත් එකඟව සිටිනු ලැබේ. ඉහත කී ආකාරයට අප විසින් නිශ්කාශනය කරගනු ලබන භාණ්ඩ විකුණනු ලබන තෙක් එම භාණ්ඩ ඔබ විසින් නියම කරන ආකාරයට ගින්න, සොරකම සහ වෙනත් සියලු සාමාන්‍ය අවදානම් හෝ වෙනත් යම් හේතු මෙන්ම ආනුෂංගික කරුණුවලට එරෙහිව නිසි පරිදි රක්ෂණයකර තබනු ලබන බවටත් ඔබ විසින් ඉල්ලා සිටියහොත් හෝ ඉල්ලා සිටීමේ දී එයට අදාල රක්ෂණ ඔප්පුව ඔබ වෙත පවරන බවටත් මේ යටතේ වූ අපගේ වගකීම් ඉටුකරනු ලබන තෙක් එම රක්ෂණ ඔප්පුව යටතේ ගෙවියයුතු රක්ෂණ මුදල් ඔබ විසින් ලබාගත හැකිවන පරිදි දරනු ලබන බවටත් අප වෙත එම මුදල් ලැබුණහොත් එම මුදල් ඔබ වෙත ගෙවන තෙක් ඔබ වෙනුවෙන් භාරයක් වශයෙන් අප විසින් දරනු ලබන බවටත් මා/ අප විසින් මෙයින් තවදුරටත් එකඟව සිටිනු ලැබේ.

(v) මේ යටතේ ගෙවීම් බලාත්මක කිරීම සඳහා වූ මාගේ/ අපගේ වගකීම ලේඛනවල පැවතියහැකි යම් වෙනස්කම් පිළිබඳව සලකා බැලීමෙන් තොරව සහ ණයවර ලිපිවල සඳහන් යම් නියම හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියාකර නොතිබීම

පිළිබඳව සලකාබැලීමෙන් තොරව පවතින බවටත් ඒ සම්බන්ධයෙන් කිසිදු හබකිරීමක් සිදුකිරීමට අපට නිදහස් අයිතියක් නොමැති බවටත් මා/ අප විසින් මෙයින් තවදුරටත් එකඟව සිටිනු ලැබේ.

(vi) ඉහත කී ආකාරයට මා/ අප විසින් නිශ්කාශනය කරනු ලබන භාණ්ඩවල තත්ත්වය හෝ ප්‍රමාණය සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් කිරීම සඳහා මට/ අපට විවෘත අවස්ථාවක් නොපවතින බවටත් එකී භාණ්ඩ ගිවිසුම්ගත තත්ත්වයට අනුකූල නොවන බවට හෝ නිශ්චිතව දක්වා ඇති කරුණුවලට හෝ වෙනත් ඕනෑම ආකාරයක හේතුවක් සමග අනුකූල නොවන බවට හබකර සිටීමට මට/ අපට හැකියාවක් නොමැති බවත් මා/ අප විසින් මෙයින් තවදුරටත් එකඟව සිටින අතර සියලුම ආකාරයෙන් මාගේ/ අපගේ අවදානම් දැරීම සහ වගකීම යටතේ මා/ අප විසින් නිශ්කාශනය කරනු ලබන භාණ්ඩවල තත්ත්වය, ප්‍රමිතිය හෝ නිශ්චිත කරුණු සම්බන්ධයෙන් කිසිදු ආකාරයකින් බැංකුව වගකියනු නොලබන බවට මා/ අප විසින් පැහැදිලි ලෙස එකඟව වගකීම් භාරගෙන සිටිනු ලැබේ.

(vii) ඔබගේ බැංකුව කෙරෙහි මෙම හානිපූරණ ලිපිය මගින් පවරා ඇති අයිතිවාසිකම් සහ බලතල ඔබ විසින් දැන් හෝ මෙහි මින්මතු මාගේ/ අපගේ ගිණුම වෙනුවෙන් හෝ ගිණුම මත දරනු ලැබිය හැකි වෙනත්යම් ඇපකරවලට අතිරේකව සහ ඒවාට අගතිවිරහිතව පැවතිය යුතු බවට ද මා/ අප විසින් මෙයින් එකඟව සිටනු ලැබේ.

(viii) භාණ්ඩ ආනයනයකිරීම සම්බන්ධයෙන් සහ මා/ අප විසින් ඒ සම්බන්ධයෙන් කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් ඔබ විසින් නියම කරනු ලැබිය හැකි සියලු විනිමය පාලන සහ ආනයන පාලන ලේඛන ඉල්ලා සිටීමේ දී ඔබ වෙත සපයන බවට මා/ අප විසින් වගකීම් භාරගෙන සිටිනු ලැබේ.

ඔබවෙත අපගෙන් ලැබිය යුතු සියලු මුදල් යම් අවස්ථාවක දී සහ කලින්කල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් මෙයින් ලබාදෙන සහ පවරනු ලබන සියලු ප්‍රතිඥා සහ බලය පැවරීම් වෙනස් නොවියයුතු මෙන්ම එම ප්‍රතිඥා සහ බලය පැවරීම් අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතුවේ.

තත්කාර්ය සඳහා අපගේ පූර්ව අනුමතය ලබා ගැනීමෙන් තොරව මේ යටතේවූ බැංකුවේ යම් හෝ සියලු අයිතිවාසිකම් වෙනත් යම් පාර්ශවයක් වෙත පැවරීම සඳහා බැංකුවට අයිතියක් ඇති බවට මා/ අප විසින් මෙයින් පිළිගෙන සිටිනු ලැබේ.

මෙම හානිපූරණ ලිපිය ශ්‍රී ලංකාවේ නීතිය මගින් පාලනයවන බවට මා/ අප විසින් පිළිගෙන සිටිනු ලැබේ.

(ඉහත සඳහන් "අපි" යන වචනය මගින් තනි පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට ස්වකීය උරුමක්කරුවන්, පොල්මඃකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් සහ පැවරුම්ලාභීන් අදහස්වන සහ අතුලත්වන අතර සමාගමක්/ සංස්ථාවක්/ ආයතනයක් සම්බන්ධයෙන් වන විට ස්වකීය අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් අදහස් වේ; නැතහොත් ඇතුලත් වේ.)

වර්ෂ 20........ ක් වූ ............................... මස ............... දිනදී ය.

නම, නිල මුද්‍රාව සහ බලයලත් අත්සන

**බලයලත් අත්සන්කරුවන්ගේ සම්පූර්ණ අත්සන තැබීම මගින් වෙනස්කිරීම් සහ මකාදැමීම් නිසි පරිදි සහතික කරනු ලැබිය යුතුවේ.**